ඇත්වීමයි.

<u>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ</u>

<u>සහායක සේවා කවුළු ක්‍රියාකරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම</u>

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සහයක සේවා කවුළු ක්‍රියාකරු තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** බඳවා ගැනීමේ ක්‍රමය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව බඳවාගනු ලැබේ

**02.** අවශ්‍ය සුදුසුකම් :

**I.** අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍යය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

සහ

දෙවරකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. උ/පෙළ විෂයන් තුනකින් සමත් වීම

**II.** කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**III.** වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම අයුරකින්ම සපුරා තිබිය යුතුය.
IV. ඉංග්‍රීසි හා දෙමළ භාෂා හැසිරවීමේ හැකියාව
V. පරිගණක භාවිතය පිළිබඳ ඇති මනා හැකියාව

**03.** සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

මෙම තනතුර තාවකාලිකය. වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ.

**04.** වයස් සීමාව

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**05.** මාසික දීමනාව

රු.25,000/=ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

06. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කර ගනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 35 | බඳවා ගනු ලබන තනතුරු සංඛ්‍යාව ලබා ගනු ලබන උපරිම ලකුණු අනුපිළිවෙල අනුව තීරණය කෙරේ |
| භාෂා හැකියාව | 30 | |
| පරිගණක හැකියාව | 30 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාව | 05 | |
| මුළු ලකුණු | 100 | |

සටහන:

I. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කෙරෙනු ඇත.

II. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබාගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු වලට බඳවා ගනු ලැබේ.

07. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය
2) වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. **අයදුම්පත් ඉදිරිපත් කිරීම**

අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ "විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සහයක සේවා කවුළු ක්‍රියාකරු තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතු අතර, අයදුම්පත් 2018.08.20 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,<br>
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,<br>
මාලිගාවත්ත, කොළඹ 10.

09. **සාවද්‍ය තොරතුරු සැපයීම**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. **පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතුවේ.**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10.

<u>ආදර්ශ අයදුම්පත්‍රය</u>

**<u>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ</u>**
**<u>සහයක සේවා කවුළු ක්‍රියාකරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම</u>**

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි)

(අදාළ අංකය කොටුව තුල ලියන්න.සිංහල 2-/දෙමළ 3-)

---

(1) සම්පූර්ණ නම :

(2) ස්ථිර පදිංචි ලිපිනය :

(3) ස්ත්‍රී/පුරුෂ භාවය :

(4) විවාහක/අවිවාහක බව :

(5) I. උපන් දිනය : II. වයස : අවුරුදු ........... මාස .......... දින ............

(6) ජාතික හැඳුනුම්පත් අංකය :

(7) දුරකථන අංක - ස්ථාවර : ජංගම:
විද්‍යුත් තැපැල් ලිපිනය:

**(8)** අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 02 යටතේ අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර

| <u>සුදුසුකම</u> | <u>ලබාගත් ආයතනය</u> | <u>ලබාගත් දිනය/කාල සීමාව</u> |
|---|---|---|
| I ………………………….. | …………………… | ………………………….... |
| II………………………. | …………………… | ………………………….... |
| III………………………. | …………………… | ………………………….... |

**(9)** අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් , නිවැරදි වූත්, තොරතුරු බව සහතික කරන අතර සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පනවනු ලබන සියළු විධිවිධානයන්ට මම යටත් වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

.....................................                                        ..................................

දිනය                                        අයදුම්කරුගේ අත්සන